# ගී සඳලුව

Gee... Sandaluwa

සිසිර දිසානායක

**කොළඹ** මහජන පුස්තකාල ශාලාව පිරී ඉතිරී ගිහින්, අළුත් කැසට් පටයක් දොරට වැඩීමක්. ශාලාවේ ඉදිරි පිවිසුම් දොරටු උළුවස්සට බර දෙමින් ඇතුළත සිදුවන දේ නිහඬව බලා සිටින අයෙක්.

''කුලේ අයියා ආරාධිතයෙක් නේද? ගිහින් වාඩි වෙන්න කෝ. අර ඉඩ තියෙන්නෙ ඉස්සරහ පේළියේ.'' සංවිධායකයෙකුගේ අවධානය ඉහතින් කී තැනැත්තාට යොමු වෙලා.

''නෑ මල්ලි ඔහොම කරගෙන යන්නකො, මං මෙහෙන් ඉන්නම්...'' කුලේ අයියා අත්දෙක බැඳගෙන තව ටිකක් අයිනට වුණේ අනික් අයට අවහිරයක් නොවෙන්න. ඔහු ගීත නිබන්ධකයින්ගේ පමණක් නොව මුළු සිංහල ගීත ලෝකයේම පතාකයෙක්. සිතින් වගේම ගතින්ද කිසිදාක වියපත් නොවන ඔහු ප්‍රවීන ගීත රචක කුලරත්න ආරියවංශ. ආරියවංශයන්ට කවුරුත් තමන්ගේ මල්ලී කෙනෙක්, එහෙමත් නැත්නම් නංගී කෙනෙක්. කුලේ අයියාව මේ වගේ උත්සවයකදී අපට නිතරම දකින්න ලැබුණේ තිරයෙන් පිටිපස්සේදී. එහෙම නැත්නම් කොරිඩෝවකදී, එහෙමත් නැත්තම් ශාලාවේ පිට වෙනත් තැනකදී.

ප්‍රේමකීර්ති ද අල්විස්, ප්‍රනීත් අභයසුන්දර, කේ.ඩී.කේ. ධර්මවර්ධන වැනි ප්‍රවීන ගිත නිබන්ධකයින් ලොවට දායාද කළ කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙක් වූ ආරියවංශයන්, තමන් දන්නා දේ අනුන්ට කියා දෙමින් ධනාත්මකව දිරිමත් කිරීමේ මහඟු ගුණය නිසා ම ආරියවංශයන් කාගේත් ''කුලේ අයියා'' වෙන්නට ඇති. සැබැවින්ම කුලේ අයියා බොහෝ අයහට සංහිඳක්ම වීය. නවකයිනට ආදර්ශයක්ම වීය. පාසල් වටපිටාවෙන් ලද හර පද්ධතිය සමඟින් නිහතමානී ගුණය නිබඳවම පළ කළ කුලේ අයියා කා සමඟින් වුවද සුහදව කටයුතු කරන අයෙක්.

කුලේ අයියාව හමුවෙන්න අප ''සිංග්ලංකා'' ආයතනයට යනවිටත් ඔහු අපව බලාපොරොත්තුවෙන් සිටියේ පෙර දැනුම් දීමක් ඇතිව ගිය නිසයි.

''කවද්ද මල්ලි ආවේ?'' කුලේ අයියා උපැස් යුවල උඩින් බලමින් අපව පිළිගත්තා.

*<u>බොහෝම දුප්පත් දැරියක් ගැනයි මේ කතාව. තාත්තා අසණීපයෙන් ඉඳලා නැතිවෙලා. මල්ලි කෙනෙකුයි, අම්මයි ඉන්නෙ.</u>*



# නුඹට සිදුවූ දේ

''අපි දීපිකාගේ ''කෑ ගසා පවසාවී'' සින්දුව ගැන කතා කරමු. එක මට ටිකක් දැනුණ අත්දැකීමක්.'' ගීත සිය දහසක් ලියා ඇති කුලේ අයියා තෝරා ගත්ත සින්දුවයි ඒ. ශාස්ත්‍රීය ගීත, බයිලා ගණයේ ගීත ඇතුළු සෑම ආරකම පාහේ ගී ලියා ඇති ප්‍රවීණයෙකු තෝරාගත් ගීයයි ඒ. අතිශයින්ම ජනප්‍රිය වූ ගීත රැසක්ම මුල් හිමික-රුවා වූ නිබන්ධකයෙකු තෝරාගත් ගීයයි ඒ.

තමන්ට දැනුණ දේ තමයි වටින්නේ. ඒ දේ තමයි සරු වෙන්නේත්. හරි දෙයක්, අළුත් දෙයක් කළොත් ජනප්‍රියත්වය අපිව හොයාගෙන ඒවි. අපිට ජනප්‍රියත්වය හොයාගෙන යන්න පුළුවන්ද? අටවා ගත්ත ජනප්‍රියකම කී දවසකටද?

''ඒ දවස්වල පත්තරයක පළවුණ සිද්ධියක් තමයි ''කෑ ගසා පවසාවී'' සින්දුව ලියවෙන්න හේතුව වුණේ.'' කුලේ අයියා මුල පිරුවා කතාවට. ''ලියවෙන්න' හේතුව වුණේ දේ ගැනයි මේ කියන්න යන්නේ. ''ලියන්න'' හේතුව වුණ දේ නෙවි. වචන දෙකේ වෙනස ''වෙ'' අකුර විතරක් වුණත් වචන දෙකේ අදහස ඉඳුරාම වෙනස්.

''බොහෝම දුප්පත් දැරියක් ගැනයි මේ කතාව. තාත්තා අසණීපයෙන් ඉඳලා නැතිවෙලා. මල්ලි කෙනෙකුයි, අම්මයි ඉන්නෙ. අම්මාත් ලෙඩ ගානේ. මල්ලිත් අංග විකලයි. කඩෙයප්පන් විකුණලා තමයි ආදායමක් ලැබුවේ.

''දැවී ලිප ළ' වේල සරි කළ
කඩපළට දී අළුයමින්''.....
අම්මට දර ටික හොයලා දීලා, වතුර ටික ලංකර දීලා, උදේ පාන්දර හදන කඩයප්පන් කඩේට ගෙනිහින් දීලා තමයි මේ ළමයා ඉස්කෝලෙ යන්නෙ. ඉස්කෝලෙ වැඩටත් දක්ෂයි.''

එක දවසක් පාන්දර මේ විදියට ඉස්කෝලෙ යන අතරමඟ දී මේ දැරියව දූෂණය කරලා මරලා දාලා.

''අඳුරු ලඳු මඟ ගෙවා අකුරට
ගෙවු මුව පැටවී
කුරා කුහුඹුවෙකුටවත් වරදක්
නොකළ දියණියනේ
නුඹට සිදු වු දේ.''

''අතු පැලේ පණ කළයි සිදුනේ දිරිය දියණියනේ''

''ඕක නිතර මේ රටේ සිද්ධ වෙන දෙයක්. නැති බැරි අය ගමේ අයටම බිලිවෙනවා. ඇත්තටම තමන්ගේ අය අතින්මයි මේ දේවල් සිද්ධ වෙන්නේ.'' දිග සුසුමක් ඉබේටම කුලේ අයියාගෙන් පිටවුණා.''

''ලපලු පත් සිඳ කුරුළු නෙත් බිඳ
දැමූ අසරණ අඩවියේ
රුදුරු නොමිනිස් දැයක සිර වී
හැඬු අසරණියේ...''

සිද්ධිය ඉතාම සංයමයකින් කුලේ අයියා වචනවලට ගොණු කළේ එහෙමයි. පත්තර වාර්තාවකයි, ගීත නිබන්ධනයකයි ඇති වෙන-සයි ඒ.

''සිද්ධිය දැකපු කෙනෙක් නෑ, සාක්ෂි නෑ, හුදකලාවේ රබර් වතු, බඩ වැටි මැදින් උදේ පාන්දර යන ගමන දකින්නේ ඉර විතරයි. ඉර දකින්න ඇති. ඒත් ඉරට කතා කරන්න බෑ. කුරුල්ලන්ට මේ ළමයාගේ විලාපය ඇහෙන්න ඇති. උන්ට තේරෙන විදියට දුක් වෙන්න ඇති.'' කුලේ අයියා තමන්ට දැනුණ කම්පාව විස්තර කළා. ගීය ලියපු දා වගේම කුලේ අයියා අදත් හැඟීම් බරවෙලා. ඒක තමයි නියම කලාකරු-වෙකුගේ ස්වභාවය. පත්තරයෙන් කියවපු දේ තමන්ට ආරෝපණය කරගෙන සරු නිර්මාණයක් කරන්න පුළුවන් වෙන්නේ ඒ කුසලතාව ලබපු අයට. ඒ දේ බලෙන් කරන්න කරන්න ගියොත් කෘතිම දෙයක් වෙනවා.

''ගී තනුව වේලාසනින් රොකොර්ඩ් :සෑප්දරා* කලා. ඇත්තටම ගයිඩ් :ඨමසාැ* එක විදියට රෝහණ වොයිස් :ඹදසජ* කරපු එක අහලා කඳුළු ආවා. රෝහණ ඇගෙන්ම අරන් කරනවා. මේ භාවමය හැඟීම් තනිකරම රෝහණගේ දයාර්ද හදවතින් එන නිර්මාණාත්මක හැඟීම්.'' කුලේ අයියා මේ කියන්නේ ප්‍රවීණ සංගීතවේදී රෝහණ වීරසිංහයන් ගැන.

''දීපිකාගේ හඬත් හැඟීම් බරව අදහස ඉදිරිපත් කරනවා. දීපිකා මගේ වචනවලට තමන්ගේ යුතුකම ඉහළින්ම ඉෂ්ඨ කළා.'' ඒ කියවුණේ විශාරද දීපිකා ප්‍රියදර්ශනීය ගැන. රෝහණ හා දීපිකා දෙපළ ඔක්තෝබර් 14 දා හවස මෙල්බර්න් නුවර මොනෑෂ් සරසවියේ රොබර්ට් බලැක්වුඩ් ශාලාවේදීත් 20 දා හවස සිඩ්නි පැරමටා හි වෙස්ටර්න් සිඩ්න් විශ්වවිද්‍යාලයේදීත් ''සරස වසන්තය'' ප්‍රසංගයේදී දැක බලා ගන්නට පුළුවන්.

''මගේ ගීත එකතුවටත් මේ සින්දුව එකතු කළේ මම ඒකට ආදරය කරන හින්දා'' ''පිනිබර මලක්'' නමින් කුලේ අයියා එළිදැක්වූ සංගීත තැටි ත්‍රිත්වයකින් යුක්ත ගී එකතුව තිස් වසරක් තිස්සේ ලියූ මේ වාගේ වටිනා ගී 66 ක එකතුවක්. තමන්ට වඩා අනුන්ට සරු නිර්මාණ එළිදක්වන්නට තෝ තැන්නක් හදා දෙන්නට නියමුවෙකු විදියට කටයුතු කරමින් 'සිංග්ලංකා'' ආයතනය මෙහෙයවන කුලේ අයියාගෙන් අප සමුගත්තේ ''සන්නස'' පාඨකයින් වෙනුවෙන් ස්තූතිවන්ත වෙමින්.

කෑ ගසා පවසාවී - හිරුට හැකි වේ නම්
සිත නෙතින් දුටු දේ
ඉකි ගසා මුමුණා වී - මිතුරුවග සියොතුන්
යෙහෙළියට වූ දේ

දැවී ලිප ළඟ වේල සරිකළ - කඩපලට දී අළුයමින්
අඳුරු ලඳු මඟ ගෙවා අකුරට ගෙවූ මුව පැටවී
කුරා කුහුඹුවෙකුටවත් වරදක් නොකළ දියණියනේ
නුඹට සිදු වූ දේ...

ලපළු පත් බිඳ කුරුළු නෙත් සිඳ - දැමූ අසරණ අඩවියේ
රුදුරු නොමිනිස් දැයක සිරවී - හැඬු අසරණියේ
අතු පැලේ පණ නළයි සිඳුනේ - දිරිය දියණියනේ
නුඹට සිදු වූ දේ...

රංජිත් රූබි සමඟ පැය තුනක්
විනෝදය සහ
නැවුම් ගීත සමගින්
සෑම ඉරිදාවකම
රාත්‍රී 8 ට හමුවෙමු

Voice of Lanka
97.7FM 3SER